# ගොවිකටයුතු

පුවත් හසුන

වෙළුම 44 තෙවන හා සිවුවන කලාපය ISSN 1991 - 040X



**කෘෂි ව්‍යවසායිකාවන් බලගන්වන ගොවිකාන්තා සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන - පිටුව -7**



**අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය සඳහා වැඩි දියුණු කරන ලද කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවල බලපෑම පිටුව 3**



**වී අලෙවිකරණයේ දී පුද්ගලික හා රාජ්‍ය අංශ වෙත සම්බන්ධ වන ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වය පිටුව 4**



**වී වගාව සංවර්ධනය සඳහා ගනු ලැබූ රාජ්‍ය ප්‍රතිපත්තිවල බලපෑම තක්සේරු කිරීම පිටුව 5**



**පහතරට තෙත් කලාපීය වෙරළබඩ දිස්ත්‍රික්කවල කුඹුරු ඉඩම් තීව්‍ර ලෙස භාවිතා කිරීමේ උපාය මාර්ග පිටුව 6**




ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නිර්මාතෘ හිටපු කෘෂිකර්ම අමාත්‍ය දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතාණන්ගේ 37වැනි ගුණ සමරුව (1983-2020) නිමිත්තෙන් සංවිධානය කළ ගුණ සමරු වැඩසටහන ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පරිශ්‍රයේ දී 2020 සැප්තැම්බර් 18 දින පැවැත්විණි.

හෙක්ටර් කොබ්බෑකඩුව සංසදය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සංවිධානය කළ මෙම වැඩසටහන සඳහා සහභාගී වූ අග්‍රාමාත්‍යතුමා හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ පිළිරුවට පුෂ්පෝහාර දැක්විය.

පුෂ්පෝපහාර දැක්වීමේ අවස්ථාව සඳහා වෙළෙඳ අමාත්‍ය බන්දුල ගුණවර්ධන, රාජ්‍ය අමාත්‍යවරුන් වන ශෂේන්ද්‍ර රාජපක්ෂ, අනුරාධ ජයරත්න, පාර්ලිමේන්තු මන්ත්‍රී මදුර විතානගේ හා හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ පවුලේ ඥාතීන් හා සම්භාවනීය අමුත්තෝ රැසක් එක්ව සිටියහ.

කෘෂිකර්ම අමාත්‍යාංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය




හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ ස්මාරකය



අගමැතිතුමාට සමරු තිළිණයක් පිළිගන්වමින්



මොහාන් සමරනායක මහතා ගුණ සමරු දේශනය පවත්වමින්




අධ්‍යක්ෂතුමා සභාව අමතමින්



ගුණ සමරු වැඩසටහනට සහභාගී වූ පිරිස

**පළමු පිටුවෙන්..**

පුෂ්පෝපහාර පුද කිරීමෙන් අනතුරුව පැවති ගුණසමරු උත්සවයේ දී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා මහතාගේ විශේෂ ආරාධනයෙන්, ගුණ සමරු දේශනය පැවැත්වූයේ ජනාධිපති මාධ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මොහාන් සමරනායක මහතා විසිනි.

කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා ඉටු කළ අනුපමේය සේවය සහ ඉඩම් ජනසතු කිරීම වෙනුවෙන් සිදු කළ මෙහෙවර මෙහි දී කෘතවේදීව සිහිපත් කරන ලදී. මෙරට ගොවිකටයුතු පර්යේෂණ ක්ෂේත්‍රයට මහත් දායකත්වයක් ලබා දෙමින් එතුමාගේ මෙහෙවරෙහි ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ස්ථාපිත කිරීම කැපී පෙනේ. එම උත්සවයේ අවස්ථා ඡායාරූපවලින් දැක් වේ.

# අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය සඳහා වැඩි දියුණු කරන ලද කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවල බලපෑම





සහලින් ස්වයංපෝෂිතභාවය සහ ග්‍රාමීය දරිද්‍රතාවය අවම කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජය සිය පොහොර සහනාධාර වැඩසටහන නව්‍යකරණය කිරීමට සැලසුම් කොට ඇත.

එබැවින්, සහනාධාර සැපයීම වඩාත් ඵලදායී කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විවිධ සහනාධාර ක්‍රමවල බලපෑම මෙන්ම ගොවීන්ගේ සහනාධාර මනාපයන් සහ වර්තමාන සහනාධාර වැඩසටහනට ප්‍රවේශවීමේ දී මුහුණ දෙන ගැටලු, අභියෝග පිළිබඳව තොරතුරු ගවේෂණය කරයි.

මෙම අධ්‍යයනයේ පරමාර්ථය, වී වගාකරුවන් අතර ගෘහස්ථ මට්ටමේ සමීක්ෂණයක් පැවැත්වීම තුළින් තිරසාර කෘෂිකාර්මික භාවිතයන් හා ඒවා භාවිතා කිරීම පිළිබඳ තොරතුරු ලබා ගැනීම මෙන් ම පොහොර සහනාධාර ප්‍රතිපත්ති සහ එහි බලපෑම පිළිබඳ තොරතුරු ගවේෂණයයි.

එය සහනාධාර ක්‍රියාත්මක කිරීමේ ක්‍රම සංසන්දනය කිරීමට සහ බලපෑම් විශ්ලේෂණය මෙන් ම හේතු අනුමාන කිරීම් වැඩි දියුණු කළ හැකි ආර්ථිකමිතික ශිල්පීය ක්‍රම උපයෝගී කර ගැනීමට ද උපකාරී වේ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ජල සම්පත් කළමනාකරණ අංශය විසින් අධ්‍යයනය සිදු කරනු ලබයි.

එහි පර්යේෂණ කණ්ඩායම ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන එම්. ඒ. සී. එස්. බණ්ඩාර, ඩබ්ලිව්. එච්. ඒ. ශාන්ත, එම්. ටී. පද්මජානි, ජී. ජී. ඩී එල්. ඩබ්ලිව්. සමරසිංහ , පර්යේෂණ නිලධාරිනි නදීෂා ඩයස් යන මහත්ම මහත්මීහු කටයුතු කරති.

මෙම සමීක්ෂණය අනුරාධපුර දිස්ත්‍රික්කයේ 'සම්පත් සුරකිමින් වගා කිරීමේ' ව්‍යාපෘතිය යටතේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය අතර පෙර සහයෝගීතාවයක් මත ගොඩනැඟේ. එම ව්‍යාපෘතිය යටතේ 2018 ඔක්තෝබර් සිට 2019 පෙබරවාරි මාස දක්වා එම දිස්ත්‍රික්කයේ ම තෝරා ගත් ගොවි සංවිධාන 110ක ගොවි පවුල් 1100ක් සඳහා සමීක්ෂණයක් සිදු කොට තිබේ. එම සමීක්ෂණයෙන් එකතු කරන ලද දත්ත කට්ටලය වර්තමාන අධ්‍යයනයට පදනම ලෙස භාවිතා වේ.

මෙම දෙවන වටයේ දත්ත රැස් කිරීමේ දී පොහොර සහනාධාර මනාපයන් සම්බන්ධ ප්‍රශ්න මෙන් ම 'ස්මාර්ට්' ජංගම දුරකතන භාවිතය, කොවිඩ් 19 බලපෑම වැනි අමතර ප්‍රශ්න කිහිපයක් එකතු කරමින් 'සම්පත් සුරකිමින්' වගා කිරීමේ ව්‍යාපෘතිය (Save & Grow Project) පිළිබඳ පෙර සමීක්ෂණය අනුරාධපුර දිස්ත්‍රික්කයේ පෙර නියැදි ගොවි පවුල් 1100ට ම නැවත සිදු කිරීමට අපේක්ෂා කරමින් සමීක්ෂණයේ දත්ත රැස් කිරීමේ දෙවැනි වටය 2020 ඔක්තොම්බර් මස ආරම්භ කර 2020 දෙසැම්බර් මස අවසාන කිරීම අපේක්ෂාව විය.

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂයේ දී එම සමීක්ෂණය පැවැත්වීම අත්හිටුවා 2021 වර්ෂයේ දී නැවත ආරම්භ කිරීමට කටයුතු යොදා තිබේ.



# වී අලෙවිකරණයේ දී පුද්ගලික හා රාජ්‍ය අංශ වෙත සම්බන්ධ වන ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වය

සහල් කර්මාන්තය රටක ආහාර සුරක්ෂිතතාවය හා ආර්ථික සංවර්ධනයෙ හි ලා ඉතාමත් වැදගත් වේ. මෙරට ලක්ෂ 9කට ආසන්න ගොවි පිරිසක් වී වගාවෙහි නිරත වෙති.

අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ පර්යේෂකයින් විසින් සිදු කළ මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ගොවීන් වී අලෙවි කිරීමේ දී රාජ්‍ය හා පෞද්ගලික අංශය තෝරා ගැනීමට ඉවහල් වන සමාජ ආර්ථික කරුණු සොයා බැලීම සහ සමස්ත වී අලෙවි ක්‍රියාවලියෙ හි කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය නිර්දේශ ලබා දීමයි. අධ්‍යයනයේ විශේෂිත අරමුණු වන්නේ විවිධ අලෙවි ක්‍රියාදාම පිළිබඳව ගොවීන්ගේ දැක්ම සහ ඔවුන් මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීම වේ.

වාර්ෂික වී වෙළෙඳපොළ අතිරික්තයෙන් 70%ට වැඩි ප්‍රමාණයක් ලබාදෙන අනුරාධපුර, අම්පාර, පොළොන්නරුව හා මඩකලපුව දිස්ත්‍රික්කවල වී ගොවීන් 345ක නියැදියක් අධ්‍යයනයට පාදක විය. වී අලෙවිකරණයේ දී ගොවීන්ගෙන් 48%ක් මුළුමනින් ම පුද්ගලික අංශය වෙත ද, ගොවීන් 52%ක් රජයේ වී මිල දී ගැනීමේ මධ්‍යස්ථාන වෙත ද, ඉතිරිය පුද්ගලික අංශය වෙත ද අලෙවි කොට තිබුණි.

මේ අනුව, රජයේ වී මිල දී ගැනීමේ මධ්‍යස්ථාන වෙත තම වී තොග අලෙවි කරන ගොවීන් ප්‍රමාණය සැලකිය යුතු මට්ටමක පවතින අතර මෙයට ප්‍රධාන හේතුව ලෙස සැලකිය හැක්කේ උපරිම අස්වැන්න ලැබෙන පෙබරවාරි, මාර්තු, මැයි මාසවල දී රජයේ සහතික මිලට වඩා පුද්ගලික අංශයේ ලබා දෙන මිල පහළ මට්ටමක පැවතීමයි. ඇතැම් අවස්ථාවල දී, මෙම වෙනස වී කිලෝ ග්‍රෑමයක් සඳහා රු.10ට ආසන්න විය. මෙම තත්ත්වය අම්පාර සහ අනුරාධපුරය දිස්ත්‍රික්කවල පුද්ගලික සහල් මෝල් අඩු, වී මිල දී ගැනීමේ මධ්‍යස්ථාන සාපේක්ෂව අඩු, දුෂ්කර ප්‍රදේශවල විශේෂයෙන් දක්නට ලැබුණ කරුණකි.

තෙතමන ප්‍රතිශතය වැඩි, අස්වනු නෙළූ විගස වී අලෙවිය සිදුකරන, ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති, වී වියැළීමට අවශ්‍ය පහසුකම් සහ ශ්‍රමය නොමැති සහ ක්ෂණික මුදල් අවශ්‍යතාවයන් පවතින ගොවීන් මෙන් ම විශාල පරිමාණයෙන් වී වගා කරනු ලබන ගොවීන් ද වැඩි වශයෙන් ම පුද්ගලික අංශය වී අලෙවිය සඳහා තෝරා ගෙන තිබුණි. එමෙන් ම වෙළෙඳපොළට නිදහස් කරන අතිරික්ත වී තොග ප්‍රමාණය අඩු, සුළු පරිමාණ ගොවීන් වැඩි වශයෙන් රාජ්‍ය අංශය වී අලෙවිය සඳහා තෝරා ගෙන තිබුණි.

අධ්‍යයනයට අනුව අඛණ්ඩ ව වැඩිවන නිෂ්පාදන වියදම, වී සඳහා ගොවීන්ට ලැබෙන මිල අඩු මට්ටමක පැවතීම සහ සාපේක්ෂව අනෙකුත් පාරිභෝගික භාණ්ඩවල මිල අඛණ්ඩ ව ඉහළයාම හේතුවෙන් වී ගොවීන්ගේ ආදායම් මට්ටම සතුටුදායක මට්ටමක නො පැවතුණි. විශේෂයෙන් මෙම තත්ත්වය අම්පාර දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබුණි. පුද්ගලික අංශයට වී අලෙවියේ දී ප්‍රධාන ගැටලුව ලෙස ප්‍රමාණවත් මිලක් නො ලැබීම සහ වෙළෙඳුන් වී මිල දී ගැනීමේදී විවිධ අක්‍රමිකතා සිදු කිරීම දක්නට ලැබුණු අතර මෙම තත්ත්වය අම්පාර සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල විශේෂිතව පැවතුණි.

රාජ්‍ය අංශයට වී අලෙවියේ දී ප්‍රධාන ගැටලු ලෙස කාලය සහ ශ්‍රමය අපතේ යාම, මිල දී ගැනීමේ ක්‍රියාවලියේදී ගැටලුවලට මුහුණදීමට සිදුවීම, වීවල ප්‍රමිතිය ඉහළ මට්ටමක පැවතිය යුතු වීම, ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිකම නිසා අලෙවිය අපහසුවීම, වී මිල දී ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වී ආරම්භ කිරීම සහ වියැළීම සඳහා පහසුකම් නොමැති වීම ප්‍රධාන විය.

පර්යේෂණ කණ්ඩායමේ නිර්දේශ අතර,

- වී සඳහා වන සහතික මිල රු.50 දක්වා ඉහළ නැංවීම
- අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කයන් හි විශේෂයෙන් කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික නොවන ආදායම් උත්පාදන මාර්ග ඇති කිරීම
- ගුදම් කුවිතාන්සි ක්‍රමය සක්‍රීය වැඩසටහනක් ලෙස වී අලෙවිකරණයට යොදා ගැනීමට කටයුතු කිරීම
- වී මිල දී ගැනීමේ ක්‍රියාවලිය සඳහා හැකිතාක් දුරට තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම
- විශාල ලෙස අතිරික්ත ලෙස වී නිපදවන ප්‍රදේශ කේන්ද්‍රකොට මහා පරිමාණ වී මෝල් කිහිපයක් ඇති කිරීම සඳහා පුද්ගලික අංශයේ ආයෝජකයන් දිරිමත් කිරීම ආදිය ප්‍රධාන වේ.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්.ඒ.එන් විජේසූරිය මහතා අධ්‍යයනයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇති අතර සම පර්යේෂකවරුන් ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී දුමින්ද ප්‍රියදර්ශන මහතා, පර්යේෂණ නිලධාරී විරාජිත් කුරුප්පු යන මහත්වරු කටයුතු කරති.



# ශ්‍රී ලංකාවේ වී වගාව සංවර්ධනය සඳහා ගනු ලැබූ රාජ්‍ය ප්‍රතිපත්තිවල බලපෑම තක්සේරු කිරීම

නිදහසින් පසු බලයට පැමිණි සෑම රජයක් ම රටේ වී නිෂ්පාදනය වැඩි කිරීමට පියවර ගත්තේ ය. සහල් ඇතුළු ආහාර බෝගවල ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සහ විවෘත වෙළෙඳපොළේ මිල ස්ථාවරව පවත්වා ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

එබැවින්, සහල්වල ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා වඩා හොඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිණිස ශ්‍රී ලංකාවේ පසුගිය දශක දෙක තුළ ක්‍රියාත්මක කරන ලද රජයේ ප්‍රතිපත්ති ඇගයීමට මෙම අධ්‍යයනය උත්සාහ කරයි.

මෙහි පර්යේෂණ සම්බන්ධීකාරක ලෙස පර්යේෂණ නිලධාරිනි දිලිනි පෙරේරා මහත්මිය කටයුතු කරන අතර ආචාර්ය ඩබ්.ඒ.ආර් වික්‍රමසිංහ, පර්යේෂණ නිලධාරිනි ඒ.කේ.ඒ දිසානායක සහ පර්යේෂණ නිලධාරිනි යූ.ඩී.ආර් උදාරි යන මහත්මීහු කටයුතු කරති.

# ඔසුපැළ රෝපණය කිරීමේ ව්‍යාපෘතියක්





ශ්‍රී ලංකාවේ දේශීය ඖෂධ අවශ්‍යතාව සපුරාලීම පිණිස ඖෂධීය පැළ වගාවන් හි ව්‍යාප්තිය හා සංරක්ෂණය සඳහා ප්‍රජාව මෙහෙයවීමේ 'හෙළ ඔසු සංවර්ධන හා සංරක්ෂණ ව්‍යාපෘතියට' සමගාමී ව ඔසු පැළ රෝපණය කිරීමේ වැඩසටහනක් 2020 සැප්තැම්බර් 17 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පැවැත්විණි. ශ්‍රීමත් අනගාරික ධර්මපාල මැතිතුමාගේ ජන්ම දිනය යෙදෙන එදිනට එම වැඩසටහනේ සමාරම්භය සනිටුහන් කරමින් දීපව්‍යාප්තව ඔසු පැළ රෝපණය කිරීම සිදුවිය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා මහතා සහ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය රංජිත් වික්‍රමසිංහ මහතාගේ මූලිකත්වයෙන් ආයතන පරිශ්‍රය තුළ ඔසු පැළ රෝපණය කළ අයුරු ඡායාරූපවල දැක් වේ.

මේ අවස්ථාවට පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශයේ අංශ ප්‍රධාන සිදත් බණ්ඩාර, මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ අංශ ප්‍රධාන එස්.එම්.ඒ සමරකෝන් සහ කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ අංශයේ අංශ ප්‍රධාන රේණුකා වීරක්කොඩි යන මහත්ම මහත්මීහු ද සහභාගී වූහ.

# ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපීය වෙරළබඩ දිස්ත්‍රික්කවල

## කුඹුරු ඉඩම් තීව්‍ර ලෙස භාවිතා කිරීමේ උපාය මාර්ග



වී වගාව යනු හුදෙක් ආහාර බෝග වගාවක් පමණක් නොව පරිසරයට හා මිනිසාට බොහෝ සේවාවන් සපයන බහු ක්‍රියාකාරී පද්ධතියකි. මෙම වැදගත්කම නිසා ශ්‍රී ලංකාවේ සියලුම කුඹුරු ඉඩම් වගා කිරීම කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභිලාශය යි.

ඊට සමගාමී ව, පුරන් කුඹුරු නැවත වගා කිරීමේ වැඩසටහන් වරින් වර දියත් කළ ද පහතරට තෙත් කලාපීය වෙරළබඩ දිස්ත්‍රික්කවල අස්වැද්දූ ඉඩම් ප්‍රමාණය හෝ ක්‍රියාකාරී කුඹුරු ඉඩම් ප්‍රමාණය හෝ වපුරන ලද බිම් ප්‍රමාණය ඔස්සේ පුරන් කුඹුරු, අස්වැද්දීමේ දායකත්වය පිළිබිඹු නොවේ. එබැවින් පුරන් කුඹුරු අස්වැද්දීමේ ඵලදායීතාව අවිනිශ්චිත ය. ක්‍රියාකාරී කුඹුරු තව දුරටත් පුරන් වන බව ද ඉන් ගම්‍ය වේ.

තව ද, වෙනත් කෘෂිකාර්මික භාවිතාවන් සඳහා ප්‍රයෝජනයට ගැනීම ද වර්ධනය වෙමින් පවතී. එසේ වුව ද, පහත රට තෙත් කලාපයේ අයුරින් වී ගොවිතැන ආශ්‍රිත වටිනාකම් හමුවේ එය අඛණ්ඩ ව පවත්වා ගැනීම සඳහා යෝග්‍ය උපාය මාර්ග හඳුනා ගත යුතු ය.

අධ්‍යයනයේ අරමුණ වන්නේ පහතරට තෙත් කලාපීය වෙරළබඩ දිස්ත්‍රික්කවල කුඹුරු ඉඩම් තීව්‍ර ලෙස භාවිතා කිරීම සඳහා විකල්ප උපාය මාර්ග හඳුනා ගැනීමයි.

අධ්‍යයනයේ නිශ්චිත අරමුණු වන්නේ,

- පහතරට තෙත් කලාපීය වෙරළබඩ දිස්ත්‍රික්කවල ක්‍රියාකාරී කුඹුරු ඉඩම් තවදුරටත් අත්හැරීම වැළැක්වීමට උපකාරීවන උපාය මාර්ග හඳුනා ගැනීම.
- පහතරට තෙත් කලාපීය වෙරළබඩ දිස්ත්‍රික්කවල අස්වද්දන ලද සහ වපුරනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය වැඩි කිරීම සඳහා පුරන් කුඹුරු නැවත වගා කිරීමේ වැඩසටහන්වල ඵලදායීතාවය වැඩි දියුණුවන උපාය මාර්ග හඳුනා ගැනීම .
- පුරන් කුඹුරුවල සිදු කරනු ලබන අනෙකුත් කෘෂිකාර්මික කටයුතුවල කාර්ය සාධනය වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග හඳුනා ගැනීම.
- වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගන්නා පුරන් කුඹුරුවල නැවත වී වගා කිරීමට ගොවීන් දිරිමත් කිරීමේ උපාය මාර්ග හඳුනා ගැනීම.

ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපීය වෙරළබඩ දිස්ත්‍රික්කවල වී වගාව මත පදනම් වූ පරිසර පද්ධතිය තවදුරටත් පිරිහීම වැළැක්වීමට උපකාරී වන උපාය මාර්ග හඳුනා ගැනීම තුළින් ප්‍රතිපත්ති සම්පාදනයට මෙම අධ්‍යයනය දායක වනු ඇතැයි පර්යේෂණ කණ්ඩායම අපේක්ෂා කරයි.

කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යයනයේ පර්යේෂණ කණ්ඩායම ලෙස අධි පර්යේෂක රේණුකා වීරක්කොඩි, පර්යේෂණ නිලධාරිනියන් වන තුෂාරා ධර්මවර්ධන, රිෆානා බුහාරි, දිනූෂා රත්නායක යන මහත්මීහු කටයුතු කරති.

# කෘෂි ව්‍යවසායිකාවන් බල ගන්වන ගොවි කාන්තා සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන



රජය විසින් දියත් කොට ඇති සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ තාක්ෂණික යෙදවුම් භාවිතය හා කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයට ලක් කර ඇති අතර ඒ සඳහා තරුණ ව්‍යවසායකයින් පෙළඹවීම සහ තිරසර සංවර්ධන උපාය මාර්ග හඳුන්වා දීම කාලීන මෙන් ම අත්‍යාවශ්‍ය කාර්යභාරයක් වේ.

කාන්තාවන්ගේ ප්‍රශස්ත හැකියාව උපයෝගී කර පවුලේ පෝෂණය, සෞඛ්‍යය හා ආදායම් ඉපැයීමේ ක්‍රියාවලියට යොමු කිරීම තුළින් දිළිදුකම පිටු දැකීම සඳහා කාන්තාවන් බල ගැන්වීමට අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම මෙම පුහුණු වැඩසටහනේ අරමුණයි.

මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 15කට අනුයුක්ත ‘සිතමු’ ගොවි කාන්තා සංවිධානවල කෘෂි ව්‍යවසායිකාවෝ මෙහි පුහුණුලාභීහු වෙති.



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම පුහුණු වැඩසටහනෙහි සම්බන්ධීකරණ කටයුතු සිදුකර තිබේ.

2020 වර්ෂයේ පළමු කාර්තුව තුළ වාලවෙල, පල්ලෙපොල, යටවත්ත, ගලේවල, දඹුල්ල, කිඹිස්ස, ඉලුක්කුඹුර, හඳුන්ගමුව, හත්තොට අමුණ, ලග්ගල, කෝන්ගහවෙල, දේවහුව, අළුගොල්ල, පලාපත්වල, හෙට්ටිපොළ යන ගොවිජන සේවා මධ්‍යස්ථාන 15ක පුහුණු ලාභීන් 1600කට වැඩි පිරිසක් පුහුණු කර තිබේ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් මහතා මෙහි සම්බන්ධීකරණ කටයුතු සිදු කළේ ය.

සම්පත් දායකයින් ලෙස අධි පර්යේෂකයින් වන එස්.එම්.ඒ. සමරකෝන්, එච්.එම්.ජේ.කේ හේරත් සහ පළාත් හා අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පත් දායකයින් පිරිසක් සම්බන්ධ වූහ.

# ගොවිකටයුතු
# පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි.
ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කෙරේ.
ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය.


*උපදේශකත්වය*

මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

*අධීක්ෂණය*

එස්.ඒ.සී.යූ සේනානායක
ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

*සම්පාදනය හා පිටු සැකසුම*

වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී


*මුද්‍රණය සහ බෙදා හැරීම*

මුද්‍රණ ඒකකය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය



දුරකථනය- 0112 696981, *Ext* : 281
ෆැක්ස් - 0112 692423
වෙබ් www.harti.gov.lk
ෆේස්බුක් https://www.facebook.com/hartilk/


## 2020 වර්ෂයේ ප්‍රකාශන




### පර්යේෂණ වාර්තා

- ඌව සහ නැගෙනහිර වනජීවී කලාප ආශ්‍රිත මිනිස්, වනසත්ත්ව ගැටුමෙ හි ස්වභාවය, තත්ත්වය සහ වත්මන් ප්‍රවණතා
- An Assessment of women Farmer’s Organizations and Empowerment Needs
- Access to and Utilizations of Microfinance by Rural Poor in Uva Province
- Possibilities to Minimize Pesticide Usage in Sri Lanka Paddy Cultivation: An Emphasis on Risk Management
- Potential of Promoting Rainwater As a Source of Safe Water for Consumption in North Central Province of Sri Lanka
- Importance of Indigenous Knowledge for Food Security : In relation to paddy cultivation
- Consumer Buying Behavior and Preference for Liquid and Powdered Milk
- Government Intervention in Paddy Marketing : Issues in purchasing and post stock management
- Export Market for Organic Food : Present Status , Constraints and Future scope
- Ban on Polythene Bags and Lunch Sheets in Sri Lanka : Impact, Challenges and Alternatives
- Good Agricultural Practices (GAP) In Sri Lanka: Status, Challenges and Policy Interventions